## කාලීන සටහන

# ජයලලිතාගේ ජය පිටුපස ඇත්ත කතාව



ඉන්දියාවේ හිටපු නියෝජ්‍ය මහ කොමසාරිස්
ප්‍රවීණ මාධ්‍යවේදී
ඇස්.පියසේන

*"මේ මැතිවරණයෙන් පසු මම මධ්‍යම රජයට බල කරනවා කච්චතිව් දූපත ආපසු ඉන්දියාවට පවරා ගන්නට කියා...." (ජයලලිතා 2011 මාර්තු රාමිනාත්පුරම්හිදී)*

"ශ්‍රී ලංකාවේ ප්‍රශ්නයට එකම විසැඳුම දෙමළ ජනතාවට ඊළාම් රාජ්‍යයක් ලබාගැනීම පමණයි." (ජයලලිතා 2011 අප්‍රේල් මානමදුරේදී)

"ජනාධිපති මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර අධිකරණයකට ගෙන යාමට ඉන්දීය මධ්‍යම රජය සහයෝගය දිය යුතුයි"
(මැයි 13 ජයලලිතා දරුස්මාන් වාර්තාවෙන් පසු ජයග්‍රාහී ප්‍රකාශය කරමින්)



ජයලලිතා ජයරාම් ප්‍රවීණ සිනමා නිළියකි. ඇය කවරදාත් රඟපෑවේ අධ්‍යක්ෂවරයාගේ මෙහෙයවීම අනුව හා තිර රචකයාගේ දෙබස් කියවමිනි. තිරයෙන් පිටදී ඇය සිතන්නේ කතා කිරීමෙන් පසුවය. ශ්‍රී ලංකාවේ ප්‍රශ්නයට එකම විසඳුම ඊළම යැයි කියන අතරම කච්චතිව් ඉන්දියාවට පවරා ගත යුතු යැයි කියන්නේ "මේ පටලැවිල්ල" නිසාය.

ඊළමක් බිහි වුවහොත් කච්චතිව් අයිතිවන්නේ ඒ ඊළමට මිස ඉන්දියාවට විය හැක්කේ කෙසේද ?

තමිල්නාඩුවේ ප්‍රාන්ත ජයග්‍රහණය නිසා ජයලලිතා මෙසේ උදම් ඇනුව ද, ඉන්දියාවේ අනෙක් ප්‍රාන්තවල අනපේක්ෂිත අන්දමින් කොන්ග්‍රස් පක්ෂ්‍ය ජය ලැබූ බැවින් පෙර පරිදි ජයලලිතා නවදිල්ලියේ කොන්ග්‍රස් කාර්යාලයේ "දොරටුවට තට්ටු කරන දිනය" වැඩි ඈතක විය නොහැකිය. එම නිසා ජයලලිතාගේ මේ "ගෝරනාඩුව" ගණන් නොගෙන "සුළඟේ පා වී යාමට ඉඩ තබා" මැයි 13 දා ප්‍රකාශයට පත් ඉන්දියාවේ ඉකුත්දා වූ ප්‍රාන්ත මැතිවරණ ප්‍රතිඵල දෙසට හැරී බලමු.

### බටහිර බෙංගාලය

බටහිර බෙංගාල ප්‍රාන්තය හඳුන්වනු ලැබුවේ ඉන්දියාවේ වාමාංශික කොමියුනිස්ට් බලප්‍රදේශය ලෙසය. පුරා දශක තුනකට වැඩි කලක් සෑම ප්‍රජාතන්ත්‍රවාදී සාධාරණ මැතිවරණයකදීම ජයලබා ගත් ලෝකයේ එකම කොමියුනිස්ට් ආණ්ඩුව බටහිර බෙංගාල ආණ්ඩුව බව අවිවාදයෙන් පිළිගත යුතුය.

එහෙත් මෙවර මැතිවරණයේදී එම ප්‍රාන්තයෙන් ඔවුන් ලැබුවේ අන්ත පරාජයකි.

මේ පරාජයට ප්‍රධාන හේතුව වුයේ චිරාගත වාමාංශික පක්ෂ අත්හැර ගොද් මාක්ස්වාදී රජයක් පිහිටුවීමට නීති විරෝධී ලෙස කැරලි ගසන "තකතීරු පොල්පොට් වාදීන් මර්දනය කිරීමට ප්‍රාන්ත රජයට නොහැකි වීමයි. එසේම දශක 4 කට පෙර කොමියුනිස්ට් වාදීන් බලයට ගෙන ඒමට සියලු කණ්ඩායම් එක්කාසුකරගත් ජ්‍යෝතිබාසුගේ "දැවැන්ත ප්‍රතිරූපය" තවදුරටත් මැතිවරණ වලදී වලංගු නොවන නිසාය.

මධ්‍යම ඉන්දියානු රජයේ "කාන්තා ගිනි පුපුර" වශයෙන් හැඳින්වුණු මම්ප්තා බැනර්ජි ඇමැතිවරිය බෙංගාලයේ මැතිවරණ සටන මෙහෙය වූවාය. ප්‍රාන්තය තුළ මතු වී ඇති අභියෝගවලින් ජය ගැනීමට ඇයට හැකිවේ ද?

මෙහිදී බෙංගාලයේ ඉතිහාසය පිළිබඳවද සැකැවින් සඳහන් කළ යුතුය. විසිවන සියවසේ බෙංගාලය ලෝක ප්‍රකට වූයේ යුග පුරුෂයන් දෙදෙනකු නිසාය. පළමුවැන්නා මහා කවි රබීන්ද්‍රනාත් තාගෝර්ය. දෙවැන්නා දැඩි මතධාරී අධිරාජ්‍ය විරෝධියකු වූ සුභාෂ් චන්ද්‍රබෝස්ය.

බේදජනක ඉස්ලාම් " හින්දු බෙදුම්වාදය නිසා ඉන්දියාව දෙකඩ වී යන විට මේ යුගපුරුෂයන් දෙදෙනාම ජීවතුන් අතර සිටියේ නැත. සිටියා නම් උපමහද්වීපය කෙසේ වෙතත් බෙංගාලය දෙකඩවීම වළක්වන්නට ඉඩක් තිබුණි.

මහා කවි රබීන්ද්‍රනාත් තාගෝර්ගේ "ජන ගන මන..." ගීතය නිදහස් ඉන්දියාවේ ජාතික ගීය වශයෙන් තෝරා ගන්නා ලදී. ලෝක ඉතිහාසයේ විශාලම ජීවිත විනාශයක් සිදු වූ 1971 බංගලාදේශ විමුක්ති සටනින් පසු පකිස්තානු ආධිපත්‍යයෙන් මිදුණු නැගෙනහිර බෙංගාලයේ බිහිවූ බංග්ලාදේශ රාජ්‍යයේ ජාතික ගීය වශයෙන් තෝරා ගන්නා ලද්දේ ද "මගේ රත්තරං බෙංගාලය" (අමාර්, සෝනාර් බංගලා...) නමැති රබීන්ද්‍රනාත් තාගෝර්ගේ පබැඳුමයි.

### කේරළය

බටහිර හා දකුණු ලංකාවට ආසන්නම ඉන්දියානු ප්‍රාන්තය කේරළයයි. භූමි ලක්ෂණයෙන්, කෑම බීම්, ඇඳුම් පැළඳුම් හා සංස්කෘතික ලක්ෂණ ආදියෙන් සිංහල පෙදෙස්වලට හාත්පසින්ම සමාන වන්නේ මේ පුංචි කේරළ ප්‍රාන්තයයි. කේරළයේ භූමි ප්‍රමාණය හා ජනගහණය ශ්‍රී ලංකාවට වඩා සොච්චමක් අඩුය. කේරළයේ භාෂාව මලයාලම්ය.

ආප්ප, පුට්ටු (පිට්ටු) හා නුල් පුට්ටු (ඉඳි ආප්ප) ඔවුනගේ ප්‍රධාන උදෑසන ආහාරයයි. ජන අනුපාතය අනුව දකුණු ආසියාවේ වැඩිම ගණනක් පුවත්පත් අලෙවි වන්නේ මලයාලම් භාෂාවෙනි. දකුණු ආසියාවේ සාක්ෂරතාව 100% ක් සපුරා ගත්තෝ කේරළ වැසියෝය.

ඉන්දියාවේ පළමුවන කොමියුනිස්ට් ප්‍රාන්ත ආණ්ඩුව බිහිවූයේ කේරළයේය. ඒ නිදහස් සටනේ පුරෝගාමියකු වූ ශංකරන් නම්බුදිරිපාද් යටතේය. වැඩිහිටියන්ට ලියන්නට හා කියවන්නට ඉගැන්වීම මහා පරිමාණයෙන් ඇරඹූ කේරළයේ කොමියුනිස්ට් රජය පාසල් රජයට පවරා ගත්තේ ද (ශ්‍රී ලංකාවේ මෙන්ම) කතෝලික පල්ලියේ බලවත් විරෝධය මැදය.

පැරණිම කොමියුනිස්ට් ආණ්ඩුව පිහිටවූයේ ඉන්දියාවේ කේරළ ප්‍රාන්තයේ වුවද එය බටහිර බෙංගාලයේ මෙන් දිගින් දිගටම පැවතුණේ නැත.

"තට්ටු මාරු ක්‍රමයට" (ශ්‍රී ලංකාවේ හා තමිල්නාඩුවේ මෙන්ම) පාලන බලය වරින් වර වම හා දකුණ අතර බෙදී ගියේය. මේ මැතිවරණයේදී ද තියුණුම සටන වාර්තා වන්නේ කේරළයේය.

ප්‍රාන්ත මන්ත්‍රී මණ්ඩලයේ ආසන 140 න් 72 ක් කොන්ග්‍රස් පෙරමුණට හිමි වූ අතර බලයේ සිටි කොමියුනිස්ට් වාමාංශික පෙරමුණ ද ආසන 68 ක් දිනාගත්තේය.

### ඇසෑමය

නැගෙනහිර ඉන්දියාවේ සීතල කඳුකරයේ පිහිටි ඇසෑම් ප්‍රාන්තය දේශපාලන සංස්කෘතිය අතින් බොහෝ දුරට බෙංගාලයට සමානය. 1947 බේදජනක බෙදීමේදී ඇසෑම් ප්‍රාන්තයෙන් කොටසක් නැගෙනහිර පකිස්තානයට වෙන් වී ගියේය. ඇසෑමයේ මෙවර කොන්ග්‍රස් පක්ෂය ලැබූ ජයග්‍රහණය සුවිශේෂිතය. එහි ආසන අසූ ගණනකින් 75 ක් වෙන් වුයේ කොන්ග්‍රස් පක්ෂයටය. ඇසෑම් ප්‍රාන්තය ලෝකයේ වැඩිපුරම තේ නිපදවන ප්‍රදේශය වේ. (මෙය ශ්‍රී ලංකාවටත් වඩා අක්කර ප්‍රමාණයෙන් වැඩිය.) ඇසෑමයේ ද ඉතා සුළු ථෙරවාදී බෞද්ධ විහාර කිහිපයක් ද තිබේ. (ඉන්දියා උප මහාද්වීපයේ ථෙරවාදී බෞද්ධ විහාරස්ථාන වැඩිපුරම ඇත්තේ දැනට බංගලාදේශයට අයත් චිතගොන් කඳුකරයේය.)

### පොන්ඩිචේරි

මේ සිඟිති ප්‍රාන්තයේ මන්ත්‍රී මණ්ඩල ආසන 30 න් බහුතරය දිනා ගන්නා ලද්දේ ප්‍රාන්තයට පමණක් ආවේණික වූ සුළු පක්ෂයක් විසිනි. පොන්ඩිචේරිය දෙමළ භාෂාව කතා කරන ජනයා වසන කුඩා ප්‍රදේශයක් වූ අතර එය 1948 ට පෙර තිබුණේ බ්‍රිතාන්‍ය නොව ප්‍රංශ යටත්විජිතයක් වශයෙනි. එහි ප්‍රංශ සංස්කෘතික ලක්ෂණ බොහෝ විට දකින්නට ඇත. පොන්ඩිචේරිය ලෝක ප්‍රසිද්ධ වී ඇත්තේ අර්බින්දෝ ඝෝෂ් ආශ්‍රමය නිසාය. බ්‍රිතාන්‍ය යටත්විජිතවාදයට විරුද්ධව කල්කටාවේදී සටන් වැදී තරුණ වියේදීම දේශපාලන රැකවරණ පතා පොන්ඩිචේරියට පලා ගිය අරවින්දෝ ඝෝෂ් කලකදී අධ්‍යාත්මික මාවතට එළැඹි මහා දර්ශනවාදී අනුගාමිකයන් පිරිසක් ඇතිකර ගත්තේය. ඔහුගේ ආශ්‍රමය අදත් ලෝක පූජිතය.

විශේෂයෙන් සඳහන් කළ යුතු දෙයක් ඇත. පොන්ඩිචේරියේ ජනතාව කතා කරන්නේ දෙමළ භාෂාව වුවද, තම සිඟිති ප්‍රාදේශීය තමිල්නාඩුවට එක්කර ගැනීමට තමිල්නාඩු දේශපාලනඥයන් දැරූ උත්සාහයට එහි වැසියෝ තරයේම විරුද්ධ වූහ.

දැන් අපි මේ මැතිවරණ පැවැත්වූ ප්‍රාන්තවල ප්‍රතිඵල වලින් මීළඟ ලොක් සභා මැතිවරණයේදී තේරී පත් වන මන්ත්‍රීන් සංඛ්‍යාව දෙස බලමු.

| | |
|---|---|
| බටහිර බෙංගාලය | " ලොක් සභා ආසන 40 යි |
| තමිල්නාඩුව | " ආසන 39 යි |
| කේරළය | " ආසන 20 යි |
| ඇසෑමය | " ආසන 12 යි |
| පොන්ඩිචේරිය | " ආසන 01 යි |

අපි යළිත් තමිල්නාඩුවෙ දෙසට හැරෙමු. කලාපීය දේශපාලන පක්ෂයක් හා හා පුරා ඉන්දියාවේ බලයට පත්වූයේ තමිල්නාඩුවේය. ඒ 1967 දීය. ඒ මැතිවරණයේදී සී. ඇන්. අන්නදුරේගේ ප්‍රධානත්වයෙන් යුත් ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් පක්ෂය ජය ගැනීමෙනි. ද්‍රවිඩ කසාගම් පක්ෂය ආරම්භ කරන ලද්දේ දැඩි ද්‍රවිඩ මතධාරී පෙරියාරි රාමසාමි නයික්කර් විසිනි. ඉන්දියාවේ වින්ධ්‍යා කඳුකරයෙන් දකුණේ පිහිටි මුළු ප්‍රදේශයම (ලංකාව ද ඇතුළුව) " ද්‍රවිඩ දේසම්" නමින් ස්වෛරී රාජ්‍යයක් පිහිටුවීමේ නයික්කර් සිහිනය ලොප් වී ගිය නමුත් ඔහුගේම අනුගාමිකයන්වූ චිත්‍රපට නිෂ්පාදකයන්, නළු නිළියන්, තිර රචකයන් හා ගීත නිබන්ධකයන් ඒකරාශී වී තමිල්නාඩුවේ ද්‍රවිඩ මුන්නේත්‍ර කසගම් නමින් නව පක්ෂයක් බිහිකර ගත්තෝය. බලයට පැමිණ වසර දෙකකට පසු අන්නදුරේ මියයෑමෙන් ඉක්බිති ඔහුගේ "අගසව්වන්" වූ මුතුවේල් කරුණානිධි හා ඇම්. ජී. රාමචන්ද්‍රන් බල " බලු පොරයක් පටන් ගත්තේය.

රාමචන්ද්‍රන් සමස්ත ඉන්දියා අන්නා ඩී. එම්. කේ. නමින් 'AIA DMK' පක්ෂයක් පටන් ගත්තේය. එදා පටන් මේ පක්ෂ දෙක "තට්ටු මාරුවෙන්" ප්‍රාන්තයේ බලයට පත්වූහ. එබඳු තරඟවලදී දිනන පක්ෂය හා පරදින පක්ෂය යන දෙකම නවදිල්ලියේ ප්‍රධාන දේශපාලන කණ්ඩායම් සමඟ සම්මුති ඇතිකර ගත්හ.

ඒ සම්මුති අනුව ප්‍රාන්තයේ ප්‍රාන්ත මන්ත්‍රී මණ්ඩලයේ වැඩි ආසන සංඛ්‍යාවක් තරග කිරීමේ අවස්ථාව ප්‍රාන්තීය පක්ෂයටත්, ප්‍රාන්තයේ ලොක් සභා ආසන වැඩි ආසන සංඛ්‍යාවක් තරග කිරීම ජාතික පක්ෂයටත් හිමිවන්නේය.

එක් උදාහරණයක් පෙන්වා දීම වැදගත්ය.

1977 මහ මැතිවරණ සහ ප්‍රාන්ත මැතිවරණයේදී ඉන්දිරා ගාන්ධිගේ කොන්ග්‍රස් පක්ෂය ගිවිසුමට එළැඹුණේ රාමචන්ද්‍රන්ගේ AIA DMK පක්ෂය සමඟය. දකුණේ ආසනවලින් කොන්ග්‍රස් පක්ෂය ජයගත්ත ද, සම්පූර්ණ මැතිවරණයෙන් පරාජය විය. කෙසේ වුවද ඇම්. ජී. ආර්. තමිල්නාඩුවේ බලය අත්පත් කර ගත්තේය.

මන්දායුෂ මුරාජි දේශායි රජය බිඳවැටීමෙන් පසු 1980 මැතිවරණයෙන් සිදු වුයේ කුමක්ද? ඉන්දිරා කොන්ග්‍රසය නිතරග ගිවිසුම ඇතිකර ගත්තේ සියල්ලන් විෂ්මයට පත් කරමින් කරුණා නිධිගේ DMK පක්ෂය සමගය.

කෙසේ වුවද වැඩි කල් නොගොස් DMK පක්ෂය තල්ලු කරමින් කොන්ග්‍රසය හා AIA DMK පක්ෂය පෙරමුණක් ගොඩනගා ගත්හ. මෙය දිගින් දිගටම සිදුවිය.

අද කොන්ග්‍රස් පක්ෂය ප්‍රධාන ප්‍රාන්ත 3 ක් පහසුවෙන් ජය ගෙන ඇත. තමිල්නාඩුවේ එය පරාජය වුයේ කරුණානිධිගේ කොටස්කාරයන් වූ නිසාය. කරුණානිධි අන්ත පරාජයකට පත් වුයේ ඇයි ? ඔහුට සහ ඔහුගේ පවුලේ හවුලට ඉදිරිපත් වී ඇති බරපතළ අල්ලස් හා දූෂණ චෝදනා මැතිවරණයේදී ජය ලලිතාගේ ප්‍රධාන ආයුධය විය.

කරුණානිධි ද ශ්‍රී ලංකාවේ දෙමළ ප්‍රශ්නය සෑම වේදිකාවකටම ගෙන ආ නිසා, ඊළම මේ ප්‍රාන්ත මැතිවරණයේ එතරම් ලොකු ප්‍රශ්නයක් නොවූ බව පැහැදිලිය.

කරුණානිධිගේ ඥාතීන් දූෂණයේ යෙදුණේ එළිපිටමය. ජයලලිතාගේ ක්‍රියාමාර්ගය ඊට හාත්පසින්ම වෙනස්ය.

ඈ ඇති දැඩි කරගත් පුත්‍රයාගේ විවාහ මංගල්‍යය සඳහා ස්වර්ණාභරණ කිලෝ ගණනින් ලැබුණේ අනුගාමිකයන්ගේ මංගල තෑගි වශයෙනි. මෙසේ රනින් තෑගි කළ කෝටිපති ස්වර්ණාභරණ ව්‍යාපාරිකයන් කෙතරම් රත්‍රන් තොග හොර රහසේ ඉන්දියාවට ගෙන ආවේ ද යන්න ප්‍රකට රහසකි. එම මංගල්‍යය සඳහා කෝටිපති ව්‍යාපාරිකයන් දෙදෙනකු මස් පිණිස එළුවන් දහසක් පරිත්‍යාග කළ බව හා තවත් පිරිසක් කුකුළන් දස දහසක් කපන්නට සැලසූ බවත් එදා වාර්තා විය.

චෙන්නායි දී පවත්වන ලද අන්තර්ජාතික සමුළුවකට සහභාගී වූ නියෝජිතයන් සියලු දෙනාට පමණක් නොව, මාධ්‍යවේදීන්ට ද ජයලලිතාගේ අත්සන යෙදූ රත්‍රන් ඔරලෝසු සිය ගණනක් පරිත්‍යාග කරන ලද්දේ ද අනුගාමිකයෙකු විසිනි. ඒවාද පරිත්‍යාගයක් මිස අල්ලස් නොවේ. දේශපාලනයේ අල්ලස හා දූෂණය පවත්වාගෙන යාමට "නීත්‍යානුකූල ක්‍රම සහ විධි " ඕනෑ තරම් ඇත.

ප්‍රවීණ මාධ්‍යවේදී
ඇස්. පියසේන

*ඇස්. පියසේන උසස් අධ්‍යාපනය ලැබුවේ කල්කටා විශ්වවිද්‍යාලයට අනුබද්ධ විද්‍යාසාගර කොලීජියේය. ඔහු 1965 " 1976 දක්වා සමස්ත ඉන්දීය ගුවන් විදුලි සේවයේ විදේශ භාෂා අංශයේ සිංහල වැඩසටහනේ ප්‍රධානියා ලෙස ක්‍රියා කළේය.*

*1984 " 85 වර්ෂවල ඔහු දකුණු ඉන්දියාවේ ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස් පදවිය ද හෙබවිය. ඉන්දු " ලංකා ප්‍රශ්න ගැන ඔහු ඉංග්‍රීසි හා සිංහල භාෂාවලින් පොත් කිහිපයක් ප්‍රකාශයට පත් කොට තිබේ.*